ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

2025 අංක 19 දරන
ජාතික විගණන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 සැප්තැම්බර් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

2025 සැප්තැම්බර් මස 26 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 50.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2025 සැප්තැම්බර් මස 22 වන දින]

එල්.ඩී. - ඕ 2/2025

2018 අංක 19 දරන ජාතික විගණන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2025 අංක 19 දරන ජාතික විගණන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 7 වන වගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2018 අංක 19 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම

"(6) (7) වන සහ (8) වන උපවගන්තිවල විධිවිධාන සලස්වා ඇති ආකාරයට හැර, යම් විගණනය කරනු ලබන ආයතනයක් සම්බන්ධයෙන් විගණනයක් සිදු කරන අවස්ථාවක දී, යම් ලිඛිත නීතියකට පටහැනිව කරන ලද යම් ගනුදෙනුවක දී යම් වංචාවක්, දූෂණයක් හෝ සාවද්‍ය පරිහරණයක් සිදු වී ඇති බවට විශ්වාස කිරීමට විගණකාධිපතිවරයාට හෝ ඔහුගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකුට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් වෙත වහාම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයා විසින් එම විගණනය කරනු ලබන ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා වෙත දැනුම්දෙනු ලැබිය යුතු ය.

(7) වංචාව, දූෂණය හෝ සාවද්‍ය පරිහරණය පිළිබඳව වන චෝදනාව ප්‍රධාන ගණන් දීමේ නිලධරයාට එරෙහිව වන අවස්ථාවක, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිය ක්‍රියාත්මක කිරීමේ

PL 15352 - 768 (2025/07)

ආයතනයක් වෙත වහාම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට විගණකාධිපතිවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වෙත දැනුම්දෙනු ලැබිය යුතු ය.

(8) විගණකාධිපතිවරයාගෙන් එවැනි නිවේදනයක් ලැබීමෙන් පසුව, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් වෙත වහාම පැමිණිල්ලක් ඉදිරිපත් කිරීම සහ (6) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද පැමිණිලි විභාග කිරීමේ ප්‍රගතිය පිළිබඳව, කලින් කල, විගණකාධිපතිවරයා වෙත වාර්තා කිරීම, අවස්ථාවෝචිත පරිදි, විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගේ හෝ අමාත්‍ය මණ්ඩල ලේකම්වරයාගේ වගකීම විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අ) පාර්ලිමේන්තුවේ ඉල්ලීමක් මත, 19 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන නිර්දේශ සලකා බැලීමේ දී අධිභාර සමාලෝචන කමිටුවේ ඉල්ලීමක් මත හෝ අධිකරණ නියෝගයක් මඟින් හෝ (ආ) වන ඡේදයට යටත්ව යම් ලිඛිත නීතියක විධිවිධාන බලාත්මක කිරීම සඳහා හැර, යම් තොරතුරක් හෙළිදරව් කරන ලෙස යම් තැනැත්තකු විසින් බලපෑම් කරනු ලැබීමට ලක් නොවිය යුතු ය;".

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "මාස පහක් ඇතුළත එක් එක් විගණනය කරන ලද ආස්ථිතයන්හි පාලක මණ්ඩලයට" යන වචන වෙනුවට, "මාස හයක් ඇතුළත, අවස්ථාවෝචිත පරිදි, එක් එක් විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාට, ගණන්

දීමේ නිලධරයාට හෝ පාලක මණ්ඩලයට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "විගණනය සිදු කිරීමේ දී වැය වූ මුදල අඩු කර," යන වචන වෙනුවට, "විගණනය සිදු කිරීමේ දී වැය වූ මුදල සහ 37 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විගණන අරමුදලට බැර කළ යුතු මුදල වන, එම ගාස්තුවෙන් සියයට පහළොවක මුදල අඩු කර," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය සංශෝධනය කිරීම

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(අ) වෙනත් යම් ලිඛිත නීතියක අන්‍යාකාරයෙන් විශේෂිතව විධිවිධාන සලස්වා ඇත්නම් මිස, යම් විගණනය කරනු ලබන ආස්ථිතයක යම් ගනුදෙනුවක් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදු කර ඇති බවටත් එම ගනුදෙනුවට සම්බන්ධ තැනැත්තන්ගේ වංචාවක්, සාවධාන නොසැලකිල්ලක්, දූෂණයක් හෝ සාවද්‍ය පරිහරණයක් හේතු කොට ගෙන යම් ඌනතාවක් හෝ පාඩුවක් සිදු වී ඇති බවටත් විශ්වාස කිරීමට විගණකාධිපතිවරයාට සාධාරණ හේතු පවතින අවස්ථාවක දී, එම විගණනය කරනු ලබන ආස්ථිතයේ එම ගනුදෙනුවේ දී සිදු වූ යම් ඌනතාවයක හෝ පාඩුවක වටිනාකම මත අධිභාරයක් පැනවීම සඳහා, 21 වන වගන්තිය යටතේ පත් කරනු ලබන අධිභාර සමාලෝචන කමිටුව වෙත විගණකාධිපතිවරයා විසින් ස්වකීය නිර්දේශ සිදු කරනු ලැබිය යුතු ය.";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්;

(3) එහි (3) වන උපවගන්තියේ -

(අ) "විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් ආපසු අය කර ගනු ලැබිය යුතු මුදල් ප්‍රමාණය අය කර ගැනීමේ දී පහත දැක්වෙන කාර්ය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය:-" යන වචන වෙනුවට, "විගණකාධිපතිවරයා විසින් සිදු කරනු ලබන නිර්දේශ මත ස්වකීය තීරණය ගැනීමේ දී අධිභාර සමාලෝචන කමිටුව විසින් පහත දැක්වෙන කාර්යය පටිපාටිය අනුගමනය කරනු ලැබිය යුතු ය:-" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (අ) වන ඡේදයේ "(1) වන සහ (2) වන උපවගන්ති" යන වචන සහ ඉලක්කම්වල සිට ආරම්භව එම ඡේදය අවසානය දක්වා වූ වචන සහ ඉලක්කම් වෙනුවට, "(1) වන උපවගන්තිය සම්බන්ධයෙන් ලිඛිතව කරුණු දක්වමින් නියෝජන ඉදිරිපත් කිරීම සඳහා එම තැනැත්තාට අවස්ථාවක් ලබා දිය යුතු ය." යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඇ) එහි (අ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(අඅ) අවශ්‍ය අවස්ථාවල දී, තීරණය ගැනීමට පෙරාතුව විගණකාධිපතිවරයාගේ නිර්දේශය සම්බන්ධයෙන් ඔහුගෙන් වැඩිදුරටත් වූ පැහැදිලිකර ගැනීම් හෝ ලේඛන ඉල්ලා සිටිනු ලැබිය යුතු ය;";

(ඈ) එහි (ඇ) වන ඡේදයේ "ප්‍රධාන ගණන් දීමේ නිලධරයා" යන වචන වෙනුවට "අධිභාර සමාලෝචන කමිටුව" යන වචන ආදේශ කිරීමෙන්;

(ඉ) එහි (ඉ) වන ඡේදයේ "(ආ) සහ (ඇ) ඡේද යටතේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්

ගනු ලබන තීරණය, ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු එක් එක් තැනැත්තන්ට, පහත සඳහන් කරුණු විශේෂිතව සඳහන් කරමින් අධිභාර සහතිකයක් නිකුත් කිරීම මඟින් දැනුම් දෙනු ලැබිය යුතු ය:-” යන වචන වෙනුවට “(ආ) වන සහ (ඇ) වන ඡේද යටතේ වන අධිභාර සමාලෝචන කමිටුවේ තීරණය, ඌණතාවයට හෝ පාඩුවට වගකිව යුතු එක් එක් තැනැත්තා වෙත, පහත සඳහන් කරුණු විශේෂිතව සඳහන් කරමින් අධිභාර සහතිකයක් නිකුත් කිරීම මඟින් එම විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා මඟින් නොපමාව සන්නිවේදනය කරනු ලැබිය යුතු ය:-” යන වචන ආදේශ කිරීමෙන්;

(4) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

“(3අ) ප්‍රධාන ගණන් දීමේ නිලධරයකු මත අධිභාරයක් පැනවීමට අධිභාර සමාලෝචන කමිටුව විසින් තීරණය කරනු ලබන අවස්ථාවක, එහි නිශ්චිතව දක්වා ඇති තොරතුරු නිශ්චිතව දක්වමින් අධිභාර සහතිකය නිකුත් කරමින්, (3) වන උපවගන්තිය යටතේ වූ ස්වකීය තීරණයේ සංනිවේදනය අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා මඟින් සිදු කරනු ලැබිය යුතු ය.

(3ආ) අධිභාර සමාලෝචන කමිටුවේ තීරණය මඟින් යම් තැනැත්තකු අතෘප්තියට පත්වන අවස්ථාවක, මේ වගන්තියේ (3) වන උපවගන්තියේ (ඉ) වන ඡේදය යටතේ හෝ (3අ) වන උපවගන්තිය යටතේ වන සන්නිවේදනය නිකුත් කළ දින සිට වැඩකරන දින තිහක් ඇතුළත ඔහු විසින් අභියාචනාධිකරණය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(3ඇ) අභියාචනාධිකරණයේ නියෝගය, අවස්ථාවෝචිත පරිදි, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් හෝ විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් අධිභාර සමාලෝචන කමිටුව වෙත සහ විගණකාධිපතිවරයා වෙත ලිඛිතව සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.";

(5) එහි (4) වන උපවගන්තියේ, "විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් හෝ එම විගණනය කරනු ලබන ආස්ථිතයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්" යන වචන ආදේශ කිරීමෙන්;

(6) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(5) 21 වන වගන්තිය යටතේ පත් කරන ලද අධිභාර සමාලෝචන කමිටුව විසින්, පහත දැක්වෙන තොරතුරු ඇතුළත් වාර්තාවක්, 29 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික විගණන කාර්යාලයේ වෙබ් අඩවියේ අර්ධ වාර්ෂිකව පළ කරනු ලැබිය යුතු ය :-

(අ) අධිභාරයක් පනවනු ලැබීම පිණිස (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය යටතේ විගණකාධිපතිවරයාගෙන් ලැබුනු නිර්දේශ සංඛ්‍යාව;

(ආ) පනවන ලද අධිභාර සංඛ්‍යාව, වෙනස් කරන ලද නිර්දේශ සංඛ්‍යාව සහ විභාග වෙමින් පවත්නා තීරණ සංඛ්‍යාව පිළිබඳ ප්‍රභේදනයක් ද ඇතුළුව අධිභාර සමාලෝචන කමිටුව විසින් සමාලෝචනය කරන ලද නිර්දේශ සංඛ්‍යාව;

(ඇ) අධිභාර සමාලෝචන කමිටුව විසින්, අවස්ථාවෝචිත පරිදි, අදාළ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් හෝ අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගෙන් ලබා ගත යුතු වූ ද, පහත දැක්වෙන කරුණු ඇතුළත් විය යුතු, ඒ වාර්තා කිරීමේ කාලසීමාව සඳහා පනවන ලද අධිභාර සහ සත්‍ය වශයෙන් අය කරනු ලැබූ අධිභාර පිළිබඳ ප්‍රකාශයක් :-

(i) (3) වන උපවගන්තියේ (ඇ) වන ඡේදය පරිදි යම් අදාළ පොලිය පිළිබඳ විස්තර ද ඇතුළුව නියමිත කාලසීමාව ඇතුළත එම ගෙවීම අයකර ගැනීම පැහැර හරිනු ලද විගණනය කරනු ලබන ආස්ථිත්‍ය; සහ

(ii) 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය ප්‍රකාර අධිභාර සමාලෝචන කමිටුව විසින් ආරම්භ කරන ලද අධිභාර මුදල් අයකර ගැනීමේ ක්‍රියාමාර්ග සංඛ්‍යාව.

(6) (4) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව ඇතුළත අධිභාර සහතිකයේ නිශ්චිතව දක්වා ඇති අය කර ගත යුතු මුදල අය කර ගැනීමට අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හෝ විගණනය කරනු ලබන ආස්ථිත්‍යයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා අපොහොසත්වන අවස්ථාවක, එම අපොහොසත්වීම සම්බන්ධයෙන් අධිභාර සමාලෝචන කමිටුව විසින්, අවස්ථාවෝචිත පරිදි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත වාර්තා කළ යුතු ය.”; සහ

(7) එම වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"අධිභාරයක් පැනවීම".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය ඉවත් කිරීම

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය මෙයින් ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අධිභාර සමාලෝචන කමිටුව පත් කිරීම

21. (1) 19 වන වගන්තිය යටතේ විගණකාධිපතිවරයා විසින් සිදු කරන ලද අධිභාරයක් පැනවීම සම්බන්ධයෙන් වූ සෑම නිර්දේශයක් පිළිබඳව ම තීරණයක් ගැනීම සඳහා අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන් පස් දෙනකුගෙන් සමන්විත වන අධිභාර සමාලෝචන කමිටුවක් තිබිය යුතු ය. :-

(අ) (මෙහි මින් මතු "සභාපතිවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිභාර සමාලෝචන කමිටුවේ සභාපතිවරයා විය යුතු විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයකු හෝ විශ්‍රාමලත් අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයකු;

(ආ) විගණනය, නීතිය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය සහ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවලින් එක් යම් ක්ෂේත්‍රයක හෝ ඊට වැඩි ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වයක් සහිත තැනැත්තන් අතරින් සාමාජිකයන් තිදෙනකු; සහ

(ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය විසින් නම් කරනු ලබන සාමාජිකයකු.

(2) ජාතික විගණන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන් අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන් වශයෙන් පත් වීම සඳහා සුදුසුකම් නොලබන්නේ ය. විගණකාධිපතිවරයා අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. අධිභාර සමාලෝචන කමිටුව විගණකාධිපතිවරයාගෙන් ස්වාධීනව ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(3) පත් කරනු ලබන දිනය වන විට වයස අවුරුදු හැත්තෑවට එළඹ ඇති තැනැත්තකු අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු වශයෙන් පත් වීම සඳහා සුදුසුකම් නොලබන්නේ ය.

(4) (1) වන, (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ජනාධිපතිවරයා විසින්, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාස තුනක් ඇතුළත හෝ අධිභාර සාමාලෝචන කමිටුවේ පුරප්පාඩුවක් ඇති වීමේ දින සිට මාස තුනක් ඇතුළත (1) වන උපවගන්තියේ (අ) වන, (ආ) වන සහ (ඇ) වන ඡේද යටතේ පත් කිරීමට නියමිත සාමාජිකයන් පිළිබඳව අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ස්වකීය නිර්දේශය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්, ජනාධිපතිවරයාගේ නිර්දේශය ලැබීමේ දින සිට දින දාහතරක් ඇතුළත, නිර්දේශය අනුමත කිරීම හෝ අනුමත නොකිරීම කරනු ලැබිය යුතු ය.

(6) ජනාධිපතිවරයා විසින්, අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ලැබීමේ දින සිට දින දාහතරක් ඇතුළත, අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන් පත් කරනු ලැබිය යුතු ය.

(7) අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු විසින්, එකී සාමාජිකයකු වශයෙන් ධුරයේ වැඩ භාර

ගැනීමට පෙරාතුව එකී පත්වීම් දිනය වන විට පවතින ස්වකීය බැඳියාවන් පිළිබඳ පොදු අනාවරණය කිරීමක් අණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(8) අධිභාර සමාලෝචන කමිටුව ඉදිරියේ සලකා බැලීමට නියමිත යම් කාරණාවක් සම්බන්ධයෙන් සෘජුව හෝ වක්‍රව බැඳියාවක් ඇති අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු විසින් එකී බැඳියාවේ ස්වභාවය අධිභාර සමාලෝචන කමිටුව වෙත අනාවරණය කරනු ලැබිය යුතු අතර එම කාරණය සම්බන්ධයෙන් අධිභාර සමාලෝචන කමිටුවේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගි නොවිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 21අ, 21ආ, 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වන අලුත් වගන්ති ඇතුළත් කිරීම

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර එම වගන්ති එම ප්‍රඥප්තියේ 21අ, 21ආ, 21ඇ, 21ඈ, 21ඉ සහ 21ඊ වන වගන්ති වශයෙන් බලාත්මක විය යුතු ය:-

“අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු වීම සඳහා වන නුසුදුසුකම්

21අ. තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වේ නම් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු බවට පත් වේ නම් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු වේ නම් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු බවට පත් වේ නම් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු බවට පත් වේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ ශ්‍රී ලකංකාවේ පුරවැසියකු වීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා වූ යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු

බවට අනාවරණය වේ නම් හෝ එසේ සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශයට පත්ව ඇත්නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් නීතියක් යටතේ වස්තුබංගත්වයට පත් වූ හෝ බුන්වත්භාවයට පත් වූ තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත් කර ඒ වස්තුබංගත්වයෙන් හෝ බුන්වත්භාවයෙන් නිදහස් නොකළ තැනැත්තකු වේ නම්;

(ඉ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනයක් ලබමින් සිටින හෝ ලබා ඇති තැනැත්තකු වේ නම්; හෝ

(ඊ) ඔහු විසින් අධිහාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලපෑමක් ඇති විය හැකි ආකාරයේ යම් මූල්‍යමය හෝ වෙනත් බැඳියාවන් පවතින තැනැත්තකු වේ නම්,

එවැනි තැනැත්තකු අධිහාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු ලෙස පත් වීම සඳහා හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව සිටීමට නුසුදුසු වන්නේ ය.

අධිහාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන්ගේ ධුරවල ධුර කාලය

21ආ. අධිහාර සමාලෝචන කමිටුවේ සෑම සාමාජිකයකු ම, ඉල්ලා අස්වීම, මියයෑම හෝ ධුරයෙන් ඉවත් කිරීම හේතුවෙන් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ස්වකීය පත්වීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුරය දරනු ලැබිය යුතු අතර ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අඛණ්ඩ හෝ එසේ නොවන තවදුරටත් වූ වාර එකකට වැඩි නොවන කාලසීමාවක් සඳහා නැවත පත් කිරීම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද, අධිභාර සමාලෝචන කමිටුවේ සභාපතිවරයාගේ සහ සාමාජිකයන්ගේ ධුර කාලය අවසන් වන අවස්ථාව වන විට, 21 වන වගන්තියේ විධිවිධාන යටතේ අධිභාර සමාලෝචන කමිටුවේ අලුත් සාමාජිකයන් පත් කරනු ලැබ නොමැති නම්, එකී ධුර කාලය අවසන් වන දිනයට පෙරාතුව ම වූ දිනයේ ධුර දරන ලද අධිභාර සමාලෝචන කමිටුවේ සභාපතිවරයා සහ සාමාජිකයන් අලුත් සාමාජිකයන් පත් කරනු ලබන තෙක් අඛණ්ඩව ධුරය දරනු ලැබිය යුතු ය.

අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන්ගේ ධුර හිස් වීම

21ඇ. (1) අධිභාර සමාලෝචන කමිටුවේ යම් සාමාජිකයකු, ඕනෑම අවස්ථාවක, තත්කාර්යය සඳහා ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මඟින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර ජනාධිපතිවරයා විසින් ලිඛිතව එම ඉල්ලා අස්වීම පිළිගනු ලබන දින සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) රෝගාතුර වීම නිසා, අශක්නුතාවය නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා අධිභාර සමාලෝචන කමිටුවේ යම් සාමාජිකයකුට තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත්වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින්, 21 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, එම සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු මියයන, ධුරයෙන් ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින්, 21 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, එම සාමාජිකයා වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර එසේ පත් කරනු ලබන තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ඉකුත් නොවූ ධුර කාලය සඳහා ධුර දරනු ලැබිය යුතු ය.

(4) ජනාධිපතිවරයා විසින්, ලිඛිතව හේතු දක්වමින් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ පූර්ව අනුමතය සහිතව අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇති සාමාජිකයකු අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයකු වශයෙන් නැවත පත් වීම සඳහා හෝ අධිභාර සමාලෝචන කමිටුවේ වෙනත් යම් තත්ත්වයකින් සේවය කිරීම සඳහා හෝ සුදුසුකම් නොලබන්නේ ය.

අධිභාර සමාලෝචන කමිටුවේ රැස්වීම් සහ ගණපූරණය

21ඈ. (1) සභාපතිවරයා විසින් අධිභාර සමාලෝචන කමිටුවේ සෑම රැස්වීමකම මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් එම රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) (අ) අධිභාර සමාලෝචන කමිටුවේ යම් රැස්වීමක දී තීරණයක් ගැනීම සඳහා වන සියලු කාරණා එම රැස්වීමේ පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

(ආ) යම් රැස්වීමක දී සලකා බලනු ලබන යම් කාරණයක් සම්බන්ධයෙන් සමාන ඡන්ද ප්‍රමාණයන් ලැබී ඇති අවස්ථාවක, එම රැස්වීමේ සභාපතිවරයාට ස්වකීය සාමාන්‍ය ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(3) අධිභාර සමාලෝචන කමිටුවේ යම් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව නිසාම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව නිසාම පමණක් අධිභාර සමාලෝචන කමිටුවේ ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් අවලංගු විය යුතු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) අධිභාර සමාලෝචන කමිටුවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු ය.

(5) මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධානවලට යටත්ව, අධිභාර සමාලෝචන කමිටුවේ රැස්වීම් සම්බන්ධයෙන් සහ එවැනි රැස්වීම්වල දී සිදු කළ යුතු කටයුතු පිළිබඳ කාර්යය පටිපාටිය සම්බන්ධයෙන් අධිභාර සමාලෝචන කමිටුව විසින් නියාමනය කරනු ලැබිය යුතු ය.

අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

21ඉ. අධිභාර සමාලෝචන කමිටුවේ සාමාජිකයන් සඳහා පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ එවැනි අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

අධිභාර සමාලෝචන කමිටුව විසින් රැස්වීම් සඳහා ප්‍රවීණයන්ට ආරාධනා කිරීම

21ඊ. (1) අධිභාර සමාලෝචන කමිටුව විසින්, එය විසින් අවශ්‍ය යයි සලකන කවර හෝ අවස්ථාවක අධිභාර සමාලෝචන කමිටුවේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා, අධිභාර සමාලෝචන කමිටුවේ යම් රැස්වීමක දී කටයුතු කරනු ලබන යම් විෂයය කාරණයක් පිළිබඳ ප්‍රවීණතාවයක් ඇති ප්‍රවීණයන්ගේ අදහස් ලබා ගැනීමේ කාර්යය සඳහා, ඒ විෂය කාරණය සම්බන්ධයෙන් ප්‍රවීණතාවයක් ඇති ප්‍රවීණයන්ට, අධිභාර සමාලෝචන කමිටුවේ එම රැස්වීම සඳහා ආරාධනා කරනු ලැබිය හැකි ය:

එසේ වුව ද, එම ප්‍රවීණයන්ගේ අදහස් පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ පරම අභිමතය අධිභාර සමාලෝචන කමිටුව සතු විය යුතු ය.

(2) ප්‍රවීණයන්ට, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම නොතිබිය යුතු ය. ''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ ''විගණනය කරනු ලබන ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා'' යන වචන වෙනුවට, ''අවස්ථාවෝචිත පරිදි, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හෝ විගණනය කරනු ලබන ආයතනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (1) වන උපවගන්තියේ "එය අය කර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය යයි විගණන සේවා කොමිෂන් සභාව සෑහීමට පත්වන අවස්ථාවක දී, 20(1) වගන්තිය යටතේ අභියාචනා කමිටුව ඉදිරියේ හෝ 20(4) වගන්තිය යටතේ අභියාචනාධිකරණයෙහි අභියාචනයක් පවතින්නේ නම් මිස, විගණන සේවා කොමිෂන් සභාව විසින්," යන වචන සහ ඉලක්කම් වෙනුවට, "එය අයකර ගැනීමට වහාම කටයුතු කිරීම අවශ්‍ය යයි අධිභාර සමාලෝචන කමිටුව සෑහීමට පත්වන අවස්ථාවක, 19 වන වගන්තියේ (3ආ) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණයෙහි අභියාචනයක් පවතින්නේ නම් මිස, අධිභාර සමාලෝචන කමිටුව විසින්," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියෙහි -

(අ) (අ) වන ඡේදයේ "විගණන සේවා කොමිෂන් සභාව" යන වචන වෙනුවට, "අධිභාර සමාලෝචන කමිටුව" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) එහි (ආ) වන ඡේදයෙහි "අවස්ථාවෝචිත පරිදි, 20(1) වන වගන්තිය යටතේ අධිභාර අභියාචනා කමිටුව වෙත හෝ 20(4) වගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් මිස," යන වචන සහ ඉලක්කම් වෙනුවට, "19 වන වගන්තියේ (3ආ) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් මිස," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) එහි (9) වන උපවගන්තියේ, “විගණන සේවා කොමිෂන් සභාව” යන වචන වෙනුවට, “අධිභාර සමාලෝචන කමිටුව” යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) එහි (10) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඍ) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

“(ඍ) 7 වන වගන්තියේ (6) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ යම් වංචාවක්, දූෂණයක් හෝ සාවද්‍ය පරිහරණයක් පිළිබඳව විගණකාධිපතිවරයා වෙතින් දැන්වීමක් ලැබී ඇති අවස්ථාවක, නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා ප්‍රමාදයකින් තොරව නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයක් වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය සංශෝධනය කිරීම

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තියේ “රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන්දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.” යන වචන වෙනුවට, “රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු එකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (1) වන උපවගන්තියේ “රුපියල් පන්දහසකට නොඅඩු සහ රුපියල් විසිපන් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.” යන වචන වෙනුවට, “රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) "විගණකාධිපතිවරයාගේ අධිකාරයලත් කවර හෝ තැනැත්තකු" යන අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

"සාවධාන නොසැලකිල්ල" යන්නෙන්, යම් ක්‍රියාවක හෝ හැසිරීමක පවතින සාධාරණ නොවන අවදානමක් පිළිබඳ දැනුවත්භාවයක් ඇතිව, නමුත් එම ක්‍රියාවේ හෝ හැසිරීමේ නිරත වන තැනැත්තා විසින් එම අවදානම වැළැක්වීම සඳහා නිසි සැලකිල්ලක් දැක්වීම පැහැර හරිමින් සිදු කරනු ලබන එවැනි යම් ක්‍රියාවක් හෝ හැසිරීමක් අදහස් වේ; ";

(2) "විගණකාධිපතිවරයා" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව" සහ "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් පත් කරනු ලබන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව අදහස් වේ;"; සහ

(3) "තොරතුරු" යන අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

" "ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය" යන්නෙන්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය අදහස් වේ;".

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.